පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்

DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 10 |

# තෙවන වාර පරීක්ෂණය - 2025

## ඉතිහාසය I

### පිළිතුරු පත්‍රය

| | |
| --- | --- |
| 01 - 2 | 21 - 2 |
| 02 - 3 | 22 - 3 |
| 03 - 4 | 23 - 2 |
| 04 - 2 | 24 - 4 |
| 05 - 2 | 25 - 1 |
| 06 - 2 | 26 - 3 |
| 07 - 4 | 27 - 3 |
| 08 - 4 | 28 - 4 |
| 09 - 1 | 29 - 2 |
| 10 - 1 | 30 - 4 |
| 11 - 3 | 31 - 4 |
| 12 - 3 | 32 - 1 |
| 13 - 3 | 33 - 1 |
| 14 - 1 | 34 - 2 |
| 15 - 3 | 35 - 3 |
| 16 - 2 | 36 - 4 |
| 17 - 2 | 37 - 4 |
| 18 - 1 | 38 - 2 |
| 19 - 2 | 39 - 1 |
| 20 - 2 | 40 - 2 |

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 10 |

# තෙවන වාර පරීක්ෂණය - 2025

## ඉතිහාසය

පාසලේ නම : ..........................................................................................................

ඇතුළත් වීමේ අංකය : ........................

කාලය : පැය 01 යි

## පිළිතුරු පත්‍රය

### I කොටස

(අ) I. A – පනාකඩුව තඹ සන්නස

B – IV වන උදය රජු

C – ස්තාම්බුල්

D - වේවැල්කැටිය

II. 1 – මිනිසා හා අශ්වහිස

2 - ඉසුරුමුණිය

3 - පර්ජන්‍ය

4 - අනුරාධපුරය

II. 1 - දේවදරුවෝ

2 - මයිකල් ආන්ජලෝ

3 - සීස්ටයින් දෙව්මැදුර

4 - යුරෝපා පුනරුදය

### II කොටස

02. i. ලෙන්ලිපි, ගිරිලිපි, පුවරුලිපි, ටැම්ලිපි, ආසනලිපි

ii. A – රොබට් නොක්ස්

B – බ්‍රාහ්මී

C – කහපණ

D – වල්ලිපුරම් සන්නස

iii. අඛණ්ඩ මූලාශ්‍රයක් ලෙස -

දික්සඳ සෙනවියා පිරිවනේ මහානාම හිමියන් විසින් රචිත මහාවංශය ආරම්භයේ සිට මහසෙන් රාජ්‍ය පාලනය අවසානය දක්වා මෙරට දේශපාලන, ආගමික, සමාජ ආදී කරුණු රැසක් අනාවරණය වේ.

ඉන් පසු වෙනත් කතුවරු කිහිපදෙනෙක් විසින් මේ දක්වා ඉතිහාස තොරතුරු ඇතුළත්ව මහාවංශය අඛණ්ඩ මූලාශ්‍රයක් ලෙස රචනා වේ.

ශිලාලිපි හා වෙනත් මූලාශ්‍ර මඟින් ගෙනහැර පාන ඓතිහාසික තොරතුරු තහවුරු කිරීමට මහාවංශය වැදගත් වේ.

iv. පෞර්ෂත්ව වර්ධණය වීම.

ඉතිහාසය අධ්‍යනය කිරීමෙන් විචාර බුද්ධිය දියුණු වන අතර, තර්කානුකූලව සිතීමට පෙළඹ වෙයි. ගැටලු නිසි පරිදි තේරුම් ගනියි. නිර්මාණාත්මක පිලිතුරු සොයයි.

- අතීත අද්දැකීම් තුළින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩ නැගීම.
- ජාතික අනන්‍යතාව හඳුනා ගැනීම.
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.

03) i. A - ගෘහපති

B - ගමික

C – පරුමක

ii. A – I වන කාශ්‍යප රජතුමා

B – දේවානම්පියතිස්ස රජතුමා

C – මහසෙන් රජතුමා

D - I වන විජයබාහු රජතුමා

iii. සාමය තහවුරු කිරීම -

දේශීය, විදේශීය සතුරන්ගෙන් රට, ජාතිය ආරක්ෂා කොට සාමය තහවුරු කිරීම.

උදා - දුටුගැමුණු රජතුමා - එළාරගෙන් රට නිදහස් කිරීම.

I වන විජයබාහු රජතුමා - චෝල පාලනයෙන් රට නිදහස් කිරීම.

- රටේ ආර්ථික සමෘද්ධිය ඇති කිරීම -

වැව් අමුණු බඳවා, ඇළවේලි තනවා කෘෂිකර්මාන්තයට පහසුකම් සැලසීම.

උදා - මහසෙන්, වසභ, ධාතුසේන, I වන පරාක්‍රමබාහු

- ආධ්‍යාත්මික සංවර්ධනයට පහසුකම් සැලසීම -

දාගැබ් මහ වෙහෙර විහාර බඳවා මිනිසුන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනයට පහසුකම් සපයා දීම.

උදා - දුටුගැමුණු රජු - රුවන්වැලි මහා සෑය, මිරිසවැටිය.

දේවානම්පියතිස්ස රජු - ශ්‍රී මහා බෝධි රෝපණය, ථූපාරාමය.

iv.

- අසල්වැසි රටවල් සමඟ සබඳතා ගෙඩනගා ගැනීම. I වන ගජබා රජතුමා (ක්‍රි.ව. 114 - 136) පතතිනි දේවාලයක් විවෘත කිරීමමේ උත්සවයකට චෝර රාජ්‍යයට ගමන් කිරීම හා පසුව පත්තිනි ඇදහිල්ල ලංකාවට ගෙන ඒම.
- භාතිකාභය රජතුමා රෝමානුක දේශයට තානාපතිවරු යැවීම හා පසුව පබළු ගෙන ඒම. පසුව රුවන්වැලි මහා සෑය පබළුවලින් අලංකාර කිරීම.
- විවාහා සබඳතා පවැත්වීම
  පොළොන්නරුවේ I වන විජයබාහු රජතුමා අසල්වැසි ඉන්දියාවේ කාලිංග දේශයෙන් තිලෝකසුන්දරී බිසව විවහා කර ගැනීම හා තම නැගණිය පාණ්ඩ්‍ය වංශික කුමරෙකුට විවහා කරදීම මඟින් සම්බන්ධතා ගොඩනගන ලදී.

04) i. A - වජ්‍රවුම්භට

B – රළපනාව/රළපැන්නුම

C – උෟරාකැට ලිං

ii. A – මිණිපේ ඇළ - ඇළහැර ඇළ

B – කලාවැව - නාච්චාදූව වැව

iii.

- සමනලවැව යකඩ උඳුන් -

සමනලවැව යකඩ උඳුන් සුළං බලය යොදා ගත් අතර, මේවා සඳහා මරං දර යොදා ගෙන ඇත. හෙමටයිට් හා ලිමොනයිට් යන පාෂාණ විශේෂ මේ සඳහා යොදා ගෙන ඇත.

- සීගිරියේ දෙහිගහ ඇළකන්දේ යකඩ උඳුන් -

දෙහිගහ ඇළකන්දේ නිස්සාරණය කිරීම සඳහා මයින හමක ආධාරයෙන් යකඩ නිපදවා ඇත.

iv.

- වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ පොත්පත් තිබීම
- රෝහල් තිබීම
  උදා - 1. පණ්ඩුකාභය මාතෘනිවාස
  2. දුටුගැමුණු රජු රෝහල් 18 ඉදි කිරීම
  3. බුද්ධදාස රජු මිනිසුන්ට මෙන්ම සත්වයින්ට ද ප්‍රතිකාර කිරීම
- ලංකාවේ විවිධ නගරවල රෝහල් නටබුන් හමුවීම.
  උදා - 1. මිහින්තලේ රෝහල
  2. පොළොන්නරුවේ ආලාහන පිරිවෙන
  3. ථූපාරාම මහා විහාර රෝහල

- බෙහෙත් චරු, ඇඹරුම්ගල්, ශෛල්‍ය වෛද්‍ය උපකරණ, කතුරු

05) I. දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොල, කෝට්ටේ

II. 1. දුර්වල රාජ්‍ය පාලනය

2. කාලිංග - පාණ්ඩ්‍ය බල අරගලය

3. ආර්ථික පරිහානිය

4. කාලිංග - මාඝ ආක්‍රමණය

III.

- අහස් වැස්සෙන් යල මහා ගොවිතැන් කිරීම

  විශාල වාරි මාර්ග බිහි නොවිණි. ජල හිඟ ප්‍රදේශවල හේන් ගොවිතැන් කිරීම

- කුරුඳු, සාදික්කා, ගම්මිරිස්, එනසාල්, කරඳමුංගු, බුලත්, පුවක් වැනි සුළු අපනයන බෝග වගා කිරීම හා ඒවා ආනයන අපනයන වෙළදාමේ නිරත වීම
- මාන්නාරම, හලාවත, මීගමුව හා කොළඹ ආදී වරාය හරහා වෙළදාම් කිරීම. ඉන්දියාව, චීනය, අරාබිය, පර්සියාව, ඊජිප්තුව වැනි රටවල් ලංකාවට වෙළඳාම සඳහා පැමිණීම.

IV. දෙවන පරාක්‍රමබාහු රජතුමා

- දේශපාලන වශයෙන් ස්ථාවර රටක් ඇති කිරීම

උදා - ජාවක චන්ද්‍රබානු දෙවරක් පරාජය කිරීම

කාලංග මාඝ පරාජය කිරී

දඹදෙණිය ස්ථාවර රාජධානියක් බවට පත් කිරීම

- බුදු දහමට අනුග්‍රහ කිරීම

දඹදෙණියේ දළදා මාළිගාවක් තැනවීම

මහ සමන් දෙවාලය ඉදි කිරීම

ත්‍රිපිටක පොතපත ලිවීම

- සාහිත්‍ය නංවාලීමට අනුග්‍රහ කිරීම

II පරාක්‍රමබාහු රජතුමා උගතෙකු වූ අතර එතුමා විසින් කව්සිළුමිණ ලියා තිබේ. එනිසාම කලිකාල සාහිත්‍ය සර්වඥපණ්ඩිත නාමයෙන් පුදනු ලැබීය.

ධර්මසේන හිමි විසින් සද්ධර්මරත්නාවලිය ද, මයුරපාද පිරිවෙන්පත් හිමි විසින් පූජාවලිය ද, සිඳත් සඟරාව වැනි පොත් පත් මෙකළ රචනා විය.

06) I. සේනාසම්මත වික්‍රමබාහු රජු

ජයවීර බණ්ඩාර රජු

කරලියද්දේ බණ්ඩාර රජු

II. A – පළමු වන විමලධර්මසූරිය රජු

B – ඇම්බැක්කේ දේවාලය

C – කුසුමාසන දේවිය

D – දොන්ජුවන් ධර්මපාල රජු

III. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා

- උපසම්පදාව පිහිටුවීම
  සියම් දේශයට දූතයන් ලවා උපාලි තෙරුන් ප්‍රමුක භික්ෂූන් වහන්සේලා වඩමවා 1753 දී මෙරට උපසම්පදාව පිහිටුවීම හා සියම් මහා නිකායේ ආරම්භය සිදු වීම.

- සංඝනායක, උපසංඝනායක තනතුරු බිහි කිරීම මඟින් බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීම.
  උදා - වැලිවිට සරණංකර හිමිට සංඝරාජ තනතුර පිරිනැමීම.

- උඩරට සියලුම වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.
  උදා - දෙගල්දෝරුව, ලංකාතිලක විහාරය

IV.

- රාජ්‍ය ඉහළම තනතුර රජතුමාට හිමිවීම -
  රටේ සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම.
  සම්ප්‍රදාය හා පෙර සිරිතට අදාළව පාලනය කිරීම.
  රටේ ආර්ථික හා පරිපාලන කටයුතු සිදු කිරීම.
- මහඅධිකාරම්වරු දෙවන අධිකාරිවරු
- මහවාසල හෙවත් ප්‍රාදේශීය පාලනය

07) I. කෝට්ටේ, මහනුවර, යාපනය

II. A 1594 - දන්තුරේ සටන

1602 - බලන සටන

1630 - රන්දෙණිවෙල සටන

1638 - ගන්නෝරුව සටන

B - 1638 - පළමු ගිවිසුම

1766 - දෙවන ගිවිසුම

III. උඩරට ප්‍රදේශවල පැවති භූගෝලීය පසුබිම - ගිරි දුර්ග, වන දුර්ග, ජල දුර්ග

උඩරට ප්‍රදේශවල පැවති දේශගුණික රටාව

උඩරැටියන්ගේ රාජ්‍ය පාක්ෂික බව

උඩරැටියන්ගේ ගරිල්ලා සටන් ක්‍රම

IV. හැකිතරම් ලාභ ලබා ගැනීමේ අරමුණින් ගැටුම් ඇති කර නොගැනීම.

රජුට දුර්ලභ ගණයේ තෑගි භෝග ලබා දීම. - සුවඳවිලවුන්, බුමුතුරුණු, පක්ෂීන් හා සිවුපාවුන්, රට අරක්කු වර්ග

උපසම්පදාව ගෙන ඒමට නාවික පහසුකම් ලබා දීම

නායක්කාර වංශික බිසෝවරු ගෙන ඒමට නාවික පහසුකම් ලබා දීම

## III කොටස

08) I. රෝමය, ජිනීවා, වැනීසිය, ප්ලෝරන්ස්

II. එංගලන්තයේ ජෝන් වයිරලීස්

බොහිමියාවේ ජෝන්හස්

ප්‍රංශයේ ඉරාමස්

ජර්මනියේ මාරටින් ලූතර්

III.

- චිත්‍ර කලාව -

ප්ලෝරන්ස් නගරය මධ්‍යස්ථානය විය.

ලෞකික රසවින්දනය හා ස්වාබාවිකත්වයට මුල් තැන දී නිර්මාණ බිහි විය.

මූර්තිවල නිරුවත් හා අඩනිරුවත් රූප බිහි විය

උදා - ලියනාඩෝඩාවින්චි - මොනාලිසා, අන්තිම රාත්‍රී බෝජන සංග්‍රහාය

මයිකල් ආන්ජලෝ - සිස්ටයින් දෙව්මැදුරේ චිත්‍ර හා අන්තිම විනිශ්චය, ආදම්ගේ චිත්‍රය

- ප්‍රතිමා කලාව -

  කිරිගරුඬින් ප්‍රතිමා නෙලීම මෙකළ ප්‍රකට විය.

  උදා - පියේටා, මෝසෙස්, දාවිත්ගේ ප්‍රතිමාව

  මයිකල් ආන්ජලෝ

- ගෘහ නිර්මාණ -

  වටකුරු ආරුක්කු, උස් කුළුණු, අර්ධ ගෝලාකාර ශිඛර

  උදා - රෝමයේ ශාන්ත පීතර බැසිලියා දෙව්මැදුර ප්ලෝරන්ස්හි අසන දෙව්මැදුර

- ලියනාඩෝ ඩාවින්චි, රෆායල් මෙකළ දක්ෂ ගෘහනිර්මාණ ශිල්පීන් ය.

IV.

- නව වෙළඳ මාර්ග සොයා ගැනීම -
  ආසියාව හා බටහිර ලෝකයට පිවිසෙන මුහුදු මාර්ග සොයා ගැනීම
- යටතේ විජිතකරණය -
  ආසියාවෙත් අප්‍රිකාවෙත් ලතින් ඇමරිකානු රටවලිත් යුරෝපා යටත් විජිතවල බල ව්‍යාපෘතිය
- වෙළදාම දියුණු වීම, වෙළඳ නගර බිහිවීම
- කතෝලික ආගම හා සංස්කෘතිය ව්‍යාපෘතිය

09) I. ඩාන්ටේ, පෙට්රාක්, බොකැෂියෝ, ලතොමස් මුවර්, ප්‍රැන්සිස් බේකන්, විලියම් ෂෙක්පියර්

II. A – පෝලන්ත ජාතික නිකලස් කොපර්නිකස් , අයිසෙක් නිව්ටන්, ජොහැන්නස් කෙප්ලර් , ගැලිලියෝ ගැලිලි

B – නිකලස් කොපනිකස් - පෘතුිවය ගෝලාකාර බව හා සූර්යා වටේ පරිභ්‍රමණය වන බව

ගැලිලියෝ ගැලිලි - ආකාශ වස්තු නිරීක්ෂණය කිරීම

III. දේශපාලන :-

- ජාතික රාජ්‍ය බිහිවීම, වෙන් වෙන්ව තිබූ ප්‍රාදේශීය රාජ්‍ය එක්කොට ජාතික රාජ්‍ය යටතේ එක්සත් විය.
- මධ්‍යම පංතිය බිහිවිය. වෙළෙන්දන් බැංකුකරුවන් නැව්හිමියන්
- මෙතෙක් කල් බලවත් වූ වංශාදිපතිවරුගේ බලය ගිලිහෙන්නට විය.

ආර්ථිකය :-

- වෙළදාම දියුණුවීම - බැංකු, මුදල් නොට්ටු භාවිතය චෙක්පත් ආදිය භාවිතය.

IV. දේශපාලනය


- මහජන නියෝජිත ආණ්ඩුක්‍රමය විකාශනය
- බටහිර පරිපාලන ක්‍රමය
- රෝම ලන්දේසි නිති ක්‍රමය


සමාජ :-

- මධ්‍යම පන්තිය හා බටහිර ඉංග්‍රිසි අධ්‍යාපන ක්‍රමය හා ඉංග්‍රිසි උගත් නව මධ්‍යම පන්තියක් බිහිවීම.
- රෝමානු කතෝලික සහ ක්‍රිස්තියානි ආගම මුල්කොටගත් බටහිර සංස්කෘතිය බිහිවිම.

ආර්ථික :-

- වැවිලි ආර්ථිකයකට පදනම වැටීම.
- ඒ හා බැදි යටිතල පහසුකම් වර්ධනය වීම.
- කොළඹ වරාය දියුණු වීම.
- නව ධනෝපායන චර්යා බිහිවීම.


කඳුරුගොඩ
N
මන්නාරම
ත්‍රිකුණාමලය
පොම්පරිප්පු
හුරුළුවැව
දැදුරුඔය
ගම්පොළ
කොළඹ
සේනානායක සමුද්‍රය
කතරගම
වලවේගඟ
දෙවුන්දර


මහාබ්‍රිතාන්‍ය
ඉතාලිය
රතු මුහුද
අප්‍රිකාව
Africa
කැලිකට්
ඉන්දියන් සාගරය
Indian Ocean
බුරුමය
බතාවිය
N